&× ´ {ÆæÈ à`Ñĺó
All Rights Reserved

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

**11 ශ්‍රේණිය**

# බුද්ධ ධර්මය - I

**කාලය පැය 1 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරන්න.

01 කුඩා කල සිට දක්ෂව හා අනලස්ව ඉගෙනීමෙහි යෙදුනු සිදුහත් කුමරාගේ ගුරුවරයා වූයේ,

(1) අසිත තවුසා (2) සබ්මිත්‍ර බමුණා

(3) කොණ්ඩඤ්ඤ බමුණා (4) ආලාරකාලාම තවුසා

02 බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්‍ය සත්‍යයේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ අන්තර්ගත සාරගර්භ කරුණු අභිබවා යන වෙනත් කිසිම ආගමික ඉගැන්වීමක් නැතැයි පැවසුවේ,

(1) එච්. ජී. වේල්ස්ය (2) එඩ්වින් ආර්නෝල්ඩ්ය

(3) රීස් ඩේවිඩ්ස්ය (4) විල්හෙල්ම් ගයිගර්ය

03 බුද්ධත්වයෙන් පසු බෝමැඩ මුල සති හතක් ගතකළ බුදුන් වහන්සේට සත් සතිය අවසානයේ දානය පිළිගැන්වූයේ,

(1) සුජාතා සිටු දියණියයි. (2) උපක ආජීවකයායි.

(3) සොත්තිය බමුණායි. (4) තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් ය.

04 බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු සත්වන සතිය ගතකළේ,

(1) රුවන්ගෙහිය. (2) අජපාල නුගරුක මුලය.

(3) මුචලින්ද නා රජ සෙවනෙහිය. (4) රාජායතන කිරිපලු නුග රුක මූලය.

05 බෝසතාණන් වහන්සේ වීර්‍ය පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය පැහැදිලි වන ජාතක කතාවකි,

(1) මඛාදේව ජාතකය (2) උම්මග්ග ජාතකය

(3) වණ්ණුපථ ජාතකය (4) තේමිය ජාතකය

06 සිදුහත් කුමරා ඉපිද පස් මසක් ගත වූ පසු පැවැති වප් මඟුල් උත්සවයේ දී එතුමා වැඩූ භාවනාව වන්නේ,

(1) මෛත්‍රී භාවනාවයි. (2) ආනාපානසති භාවනාවයි.

(3) අසුභ භාවනාවයි. (4) මරණානුස්මෘති භාවනාවයි.

07 සිදුහත් කුමරයා අනාගතයේ බුදුවන බවට අනාවැකියක් පළමුවරට ප්‍රකාශ කළේ,

(1) අසිත තවුසාය. (2) ආලාරකාලාම තවුසාය.

(3) කොණ්ඩඤ්ඤ බමුණාය. (4) උද්දකරාමපුත්ත තවුසාය.

08 පංචස්කන්ධය ලෙස හැඳින්වෙන සත්වයාගේ කායික හා මානසික ක්‍රියාකාරිත්වය වන්නේ,

(1) රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ

(2) රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ

(3) ඇස, කන, නාසය, දිව, ශරීරය

(4) කාලය, දීපය, දේශය, කුලය, මව

09 දුක, දුකට හේතුව, දුක නැති කිරීම හා දුක නැතිකිරීමේ මාර්ගය යන උතුම් සත්‍ය පිළිබඳ නිවැරදි දැක්මක් ඇතිකර ගැනීම

(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි.

(3) සම්මා වායාමයයි. (4) සම්මා සමාධියයි.

10 සිදුහත් කුමරා උපත ලැබුවේ කොසොල් රටට අයත් ශාක්‍ය ජනපදයේ අගනුවර වූ

(1) දෙව්දහ නුවරය (2) සැවැත් නුවරය

(3) කපිලවස්තු පුරයෙහිය (4) කිඹුල්වත් නුවරය

11 සියලු බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනාව පිළිබඳ දැක්වෙන ධම්මපද ගාථාව වන්නේ,

(1) ''නහිවේරේන වේරානි'' යන ගාථාවයි.

(2) ''අක්කොච්ඡිමං අවධිමං'' යන ගාථාවයි.

(3) ''සබ්බ පාපස්ස අකරණං'' යන ගාථාවයි.

(4) ''උට්ඨානවතෝ සතිමතෝ'' යන ගාථාවයි.

12 ගිහිගෙය අතහැර පැවිදි වූ සිදුහත් තාපසතුමා ආචාර්යවරුන් සොයා යන අතරමගදී එතුමාට හමුවූයේ,

(1) කොසොල් රජතුමාය (2) බිම්බිසාර රජතුමාය

(3) අජාසත් රජතුමාය (4) උදේනි රජතුමාය

13 ජීවිතයෙහි පවත්නා දුකත්, එම දුක් සහගත බවට හේතුවත්, එම දුක නිවාගැනීම හා දුකෙන් මිදීමේ පිළිවෙතත් යන චතුරාර්ය සත්‍යය අවබෝධයෙහිලා පූර්වංගම වන මැදුම් පිළිවෙතෙහි අංගය වන්නේ,

(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි.

(3) සම්මා ආජීවයයි. (4) සම්මා වායාමයයි.

14 තමන්වහන්සේ අවබෝධ කළ ධර්මය ගැඹුරු බවත්, කෙලෙස් හරිත සාමාන්‍ය ජනයාට අවබෝධ කළ නොහැකි බවත් මෙනෙහි කරමින් සිටි බුදුරජාණන් වහන්සේට ධර්මය දේශනා කිරීමට ආරාධනා කළේ,

(1) ගවම්පතී මානවකයාය (2) හුහුංක බ්‍රාහ්මණයාය

(3) සට්කාර මහා බ්‍රහ්මයාය (4) සහම්පති මහා බ්‍රහ්මයාය

15 බුදුන්වහන්සේ වෙත පැමිණෙන උපාසක උපාසිකාවන්ට දහම් දෙසීමට ගතකළ කාලය, දවස බෙදා ඇති කොටස් පහ අතුරෙන් හැඳින්වෙන්නේ,

(1) පෙරබත්කිස නමිනි. (2) පසුබත්කිස නමිනි.

(3) පෙරයම්කිස නමිනි. (4) මැදියම්කිස නමිනි.

16 ''දෙහොත් මුදුනින් තබා නමස්කාර කිරීමට සුදුසු'' යන සඟ ගුණය ප්‍රකාශ වන පාලි පාඨය වන්නේ,

(1) ආහුනෙය්‍ය යන්නයි. (2) පාහුනෙය්‍ය යන්නයි.

(3) දක්ඛිනෙය්‍ය යන්නයි. (4) අංජලිකරණීය යන්නයි.

17 මෛත්‍රී භාවනාව වැඩීම ආරම්භ කරන පුද්ගලයා තුළ පැවතිය යුතු යැයි කරණීයමෙත්ත සූත්‍රයේ දැක්වෙන ගුණාංග අතර ''ආඩම්බරයෙන් තොරවීම'' හැඳින්වෙන්නේ,

(1) සුවචෝ නමිනි. (2) අනතිමානී නමිනි.

(3) නිපකො නමිනි. (4) සුභරෝ නමිනි.

18 ''ජවෝ ජවාය සද්ධිං සංවසති'' යන පාඨයේ අදහස පිරිමි මළ කඳක් ස්ත්‍රී මළ කඳක් හා සමග විසීමය. මෙම කරුණ ඇතුළුව සතරාකාර පවුල්දිවිය පිළිබඳ විස්තර ඇතුළත් සූත්‍රය වන්නේ,

(1) සිඟාලෝවාද සූත්‍රයයි. (2) මංගල සූත්‍රයයි.

(3) චතු සංවාස සූත්‍රයයි. (4) ව්‍යග්ගපජ්ජ සූත්‍රයයි.

19 මිනිස් ක්‍රියාකාරකම්වල ඇත්තේ අරුම පුදුම ශක්තියකි. මෙය කර්ම ශක්තිය වශයෙන් බුදු දහම හඳුන්වයි. කර්ම ශක්තියේ බලපෑම අනුව බුදු දහමට අනුකූල කියමන වන්නේ,

(1) අපගේ ජීවිතයේ සිදුවන, කෙරෙන සියල්ල අතීත කර්මවල බලපෑම මත රඳා පවතින බවයි.

(2) අප කරන ක්‍රියා පිළිබඳ අපට වගකීමක් නැත යන්නයි.

(3) පෞද්ගලිකව අප කරන කියන දේ තුළින් සමාජයට සිදුවන බලපෑමක් නැත යන්නයි.

(4) අපගේ ජීවිතවලට අතීත කර්ම බලපායි යන්නයි.

20 බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය ''ධම්මචක්කප්පවත්තන'' නමින් හඳුන්වයි. මෙහි අදහස වන්නේ,

(1) දහම නමැති රෝදය කරකැවීමය.

(2) දහම් අවබෝධයෙන් ලෝකයා කුසලයට යොමුකිරීමය.

(3) ධර්ම ප්‍රචාරයෙන් රාජ්‍යයන් ජයගැනීමය.

(4) ධර්මය නමැති රෝදය ඉදිරියට ගමන් කරවීමය.

21 පාරමිතා ධර්ම සම්පූර්ණ කරන ආකාරය අනුව සෑම පාරමිතාවක්ම කොටස් තුනකට බෙදේ. ඒවා නම්,

(1) බුදු, පසේ බුදු, මහරහත් යන්නයි.

(2) තෘෂ්ණා, මාන, දිට්ඨි යන්නයි.

(3) පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී යන්නයි.

(4) ස්වාර්ථ, පරාර්ථ, උභයාර්ථ යන්නයි.

22 යමකු උපත ලැබීමේ දී ජනක කර්මය සඳහා බලපාන්නේ,

(1) ගරුක කර්මයයි. (2) ආසන්න කර්මයයි.

(3) ආචින්න කර්මයයි. (4) කටත්තා කර්මයයි.

23 පුනර්භවය පිළිබඳව ලංකාවෙන් සොයාගත් සිද්ධි විස්සක් පමණ වාර්තාකොට වෙනමම පොතක් ලියා ඇත්තේ,

(1) රීස් ඩේවිඩ් පඬිතුමාය (2) ඉතිහාසඥ එච්. ජී. වේල්ස්ය

(3) මහාචාර්ය ඉයන් ස්ටීවන්සන්ය (4) ශ්‍රීමත් එඩ්වින් ආර්නෝල්ඩ්ය

24 ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවූයේ,

(1) උඳුවප් පෝය දිනකය. (2) දුරුතු පෝය දිනකය.

(3) පොසොන් පෝය දිනකය. (4) වෙසක් පෝය දිනකය.

25 වරදක් කර සමාජයෙන් කොපමණ හැංගී සිටීමට හැකිවුවත් එය තම සිතෙන් හැංගීමට අපට නොහැක. මෙසේ තම සිතින් කරනු ලබන බලපෑමට යටත්ව සීලය ආරක්ෂා කිරීම හඳුන්වන්නේ,

(1) ධම්මාධි පතෙය්‍ය යනුවෙනි. (2) අත්තාධි පතෙය්‍ය යනුවෙනි.

(3) ලෝකාධි පතෙය්‍ය යනුවෙනි. (4) ඒකාධි පතෙය්‍ය යනුවෙනි.

26 ථේරවාද බෞද්ධ සම්ප්‍රදායේ ඉතිහාසය තුළ භික්ෂූන් වහන්සේලා විසින් පැවැත්වීමට යෙදුනු ධර්ම විනය සංගායනා ගණන,

(1) හතරකි. (2) පහකි. (3) හයකි. (4) අටකි.

27 නිල්වන් තණකොළ මත මළ මුත්‍රා හෙළීම, කුණුරොඩු ඉඳුල් හෙළීම තහනම් කරන ලද්දේ,

(1) ගිහියන්ටය (2) සිසුන්ටය

(3) සාමණේර භික්ෂූන්ටය (4) උපසපන් භික්ෂූන්ටය

28 යුතුකම් ඉටුකරන අන්‍යෝන්‍ය සුහදතාවය පිරි සමාජයකට මග පෙන්වන සිඟාලෝවාද සූත්‍රයේ උඩ දිසාවෙන් සංකේතවත් වන්නේ,

(1) ගිහි පැවිදි සබඳතාවයි. (2) සේව්‍ය සේවක සබඳතාවයි.

(3) ගුරු සිසු සබඳතාවයි. (4) හිතමිතුරු සබඳතාවයි.

29 පරපණ නැසීමෙන්, සොරකමින් හා කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී යහපත් සදාචාරසම්පන්න ජීවිතයක් ගතකිරීමේ දී වර්ධනය වන ආර්ය මාර්ගය වන්නේ,

(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි.

(3) සම්මා සමාධියයි. (4) සම්මා කම්මන්තයයි.

30 අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නයට අයත් වන්නේ,

(1) සතර මග අවබෝධ කළ උතුමන්ය.

(2) සතර ඵල අවබෝධ කළ උතුමන්ය.

(3) සතර මග හා ඵල අවබෝධ කළ උතුමන්ය.

(4) සතර බ්‍රහ්ම විහරණ වැඩූ උතුමන්ය.

The National e-Learning Portal for The General Education

31 කිසියම් ක්‍රියාවක් කුශල කර්මයක් වීම සඳහා මුල්විය හැකි චේතනා වන්නේ,

(1) අනිත්‍ය, දුක්ඛ, අනාත්මයි (2) අලෝභ, අදෝස, අමෝහයි

(3) ලෝභ, දෝස, මෝහයි (4) නියත, සුබ, ආත්මයි

32 නිසි කලට වැසි ලැබීම, ගංවතුර ගැලීම, සුනාමි වැනි කාලගුණික තත්වයන් ඇතිවන්නේ,

(1) බීජ නියාමය නිසාය. (2) කම්ම නියාමය නිසාය.

(3) චිත්ත නියාමය නිසාය. (4) උතු නියාමය නිසාය.

33 තෙරුවන් ගුණ පිළිබඳ මනා අවබෝධය තුළින් ඇතිවන පැහැදීම බුදු දහමෙහි හඳුන්වන්නේ,

(1) භක්තිය ලෙසයි. (2) අමූලිකා සද්ධා ලෙසයි.

(3) ආකාරවතී සද්ධා ලෙසයි. (4) ප්‍රසාදය ලෙසයි.

34 පුද්ගල සිතෙහි පවත්නා සියලු කෙලෙසුන් නැති කිරීමෙන් උපදවාගන්නා ඥාණය බුදු දහමේ හඳුන්වන්නේ,

(1) ආසවක්ඛය ඥාණය නමිනි. (2) මාර්ග ඥාණය නමිනි.

(3) දිබ්බ සෝත ඥාණය නමිනි. (4) චේතෝ පරියාය ඥාණය නමිනි.

35 බුදුරජාණන් වහන්සේ ශාස්තෲන් වහන්සේ නමක් මෙන්ම පරිසරවේදියෙක් ද වෙයි. උන්වහන්සේ පරිසරවේදියෙක් වන්නේ,

(1) පරිසරයට ඇලුම් කළ නිසාය.

(2) ආරණ්‍ය සේනාසනවල ජීවිතය ගෙවූ නිසාය.

(3) වන සතුන්ට කරුණාව, මෛත්‍රිය දක්වූ නිසාය.

(4) තමා පරිසරය අගය කළාක් මෙන් ශ්‍රාවකයන්ද ඒ සඳහා යොමුකළ නිසාය.

36 සෞන්දර්‍ය අගය කරන බුදු සමය සිවුර සකස් කර ඇත්තේ මගධ දේශයේ පිහිටි කෙත්යායක හැඩයටය. එහෙත් එම සිවුරු පරිහරණය කිරීමේ දී නොසලකාහැරිය යුත්තක් වන්නේ,

(1) සීතලෙන් හා උෂ්ණයෙන් ආරක්ෂාවීම සඳහා යන්නය.

(2) අලංකාරය සඳහා යන්නය.

(3) මැසිමදුරු උවදුරුවලින් ආරක්ෂා වීම සඳහා යන්නය.

(4) සුළඟින් හා අව් රශ්මියෙන් වැළකීම සඳහා යන්නය.

37 පුද්ගලයකු සිදුකරන සියලු ක්‍රියාකාරකම්වලට ධාර්මික න්‍යාය පදනම් විය යුතුය. ධනය ඉපයීමේදී ද මෙය මෙසේමය. ධාර්මික ධනෝපායනය ලෙස බුදු දහම අගය කරන්නේ,

(1) අඩු ශ්‍රමයකින් වැඩි ලාභ ඉපයීමයි.

(2) බාහු බලයෙන් හා දහඩිය වැගිරීමෙන් ධනය ඉපයීමයි.

(3) අයිතිවාසිකම් ගැන පමණක් සිතමින් ජීවනෝපායේ යෙදීමයි.

(4) සියලු වරප්‍රසාද අත්නොහැර භුක්ති විඳිමින් සේවය කිරීමයි.

38 දරුවන්ගෙන් සංග්‍රහ ලබන දෙමව්පියන් විසින් තම දරුවන්ට නොකළයුතු සංග්‍රහයක් වන්නේ,

(1) දරුවන් පවින් වැළැක්වීමය. (2) යහපතෙහි පිහිටුවීමය.

(3) සුදුසු කල දායාද පවරාදීමය. (4) පරපුර රැකගැනීමය.

39 වරෙක පංචසික නම් දිව්‍ය සංගීතඥයාගේ වීණා වාදනයක් බුදුන් වහන්සේ විසින් අගය කර ඇත. මෙම දහම සුන්දරත්වය අගය කරනුයේ,

(1) සරාගී චේතනා පෙරටු කරගෙනය.

(2) නික්ලේශී මනසකින්ය.

(3) අසුභවාදී මනසකින්ය.

(4) සරාගී බව හා විරාගී බව සංකලනයවූ හැඟීමෙනි.

40 ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා උපදෙස් ලබාදෙන කරුණු අතරට අයත් නොවන්නේ,

(1) සප්ත අපරිහානීය ධර්ම යන්නයි. (2) දස සක්විතිවත් යන්නයි.

(3) දසරාජධර්ම යන්නයි. (4) සතර උපාදාන යන්නයි.

&i h , u y u l u wej r K
All Rights Reserved

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ. ((1) - ලකුණු 02 (2) - ලකුණු 03 (3) - ලකුණු 05 වශයෙනි.)**

01 කෙටි පිළිතුරු සපයන්න.

(1) බුදුන්වහන්සේ නව මානව වංශයක් පහළ කළ බව ප්‍රකාශ කළ ඉන්දියානු පඬිවරයා නම් කරන්න.

(2) ධම්ම පදයේ වර්ග ප්‍රමාණය හා ගාථා ගණන වෙන වෙනම දක්වන්න.

(3) ''වෛරයෙන් වෛරය නොසංසිඳේ.'' මෙම අදහස ඇතුළත් ධම්ම පද ගාථාව ලියන්න.

(4) සිඟාලක ගෘහ පුත්‍රයාට බුදුරඳුන් වදාළ සදිසා නමස්කාරය සමාජ සබඳතාවයන්ගේ ධාර්මික පිළිවෙත උගන්වයි. එහි දකුණ හා උතුරු දිසාව ලෙස දක්වා ඇත්තේ කවුද?

(5) විහාරස්ථානයක ප්‍රධාන වශයෙන් චෛත්‍ය තුනක් දක්නට ලැබේ. ඉන් දෙකක් නම් කරන්න.

(6) මහින්දාගමනයෙන් පසු මෙරට ඉදිවූ ප්‍රථම ස්තූපය නම් කරන්න.

(7) පාරමී ධර්ම පුරන ආකාරය අනුව සෑම පාරමිතාවක්ම කොටස් තුනකට බෙදේ. ඉන් දෙකක් නම් කරන්න.

(8) සෙල්ලම් සිතින්වත් - යම්කිසි තරහකින්වත්
මරණ සිතකින්වත් - සතුන්හට වදදීම නොහොබිත්
මෙම පද්‍ය ඇතුළත් කෘතිය නම් කරන්න.

(9) ''පාලකයා සතර අගතියෙන් වැළකී පාලන කටයුතු මෙහෙයවිය යුතුය.'' සතර අගතියෙන් දෙකක් නම් කරන්න.

(10) ''අප නැවත උපදිනවා'' යන කරුණ පිළිබඳව ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගැනීමට හැකි ඤාණ දෙක නම් කරන්න.

02 (1) මෛත්‍රී වැඩීමට අදාළ කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව නම් කරන්න.

(2) එම සූත්‍රයේ සඳහන් පරිදි මෛත්‍රී වඩන පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(3) සාමකාමී සමාජයක් ගොඩනැගීමට මෛත්‍රී සහගත පැවැත්ම ඉවහල් වන අයුරු පහදන්න.

03 (1) දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි සඳහන් අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න.

(2) චතුරාර්‍ය සත්‍යය ලියා දක්වන්න.

(3) සදාචාර සම්පන්න සමාජයක් සඳහා අරි අටඟි මගෙහි සීල ශික්ෂාව ඉවහල්වන අයුරු පහදන්න.

04 ''කිසිදු විටෙක තමන් නිසා හෝ අනුන් නිසා හෝ තම දරුවන් නිසා හෝ රටවැසියන් නිසා හෝ අධාර්මිකව ධනය නොඉපදවිය යුතුය.'' මෙය බුදුරදුන් දේශනා කළ ගාථාවක අදහසයි.

(1) මෙයින් විස්තර වන්නේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ කිනම් මාර්ගාංගයක්ද?

(2) බුදුරදුන් අනුදත් ධාර්මිකව ධනය උපයාගතහැකි රැකියා තුනක් නම් කරන්න.

(3) අධාර්මිකව ධනය උපදවනවාට වඩා දැතේ වීර්‍යයෙන් දැහැමින් ධනය උපයාගෙන සාර්ථක ජීවිතයක් ගතකළ හැකි අයුරු පහදන්න.

05 (1) යසස වැඩීමට ඉවහල් වන කරුණු ඇතුළත් ධම්මපද ගාථාව ලියන්න.

(2) එම ගාථාවේ දක්වෙන යසස වැඩීමට ඉවහල්වන දහම් කරුණු තුනක් ලියන්න.

(3) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක්කරන්න.

06 (1) ප්‍රධාන බෞද්ධ භාවනා විධි දෙක ලියන්න.

(2) ඉන් නුවණ දියුණුවන භාවනාව පිළිබඳ පහදන්න.

(3) භාවනාව තුළින් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ප්‍රයෝජන මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

07 (1) දසරාජ ධර්මවලින් දෙකක් නම් කරන්න.

(2) සතර සංග්‍රහ වස්තුවලින් තුනක් කෙටියෙන් හඳුන්වන්න.

(3) දැහැමි රාජ්‍ය පාලනයක් ගෙනයාමේ දී දසරාජ ධර්මවල අදාළත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.